**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**
**කොන්ත්‍රාත් ගිවිසුම් පත්‍රය**

ගිවිසුම් අංකය : ........................................ දිනය : ........................................

දිස්ත්‍රික්කය : මාතර වැඩසටහන : ........................................

සේවා ශීර්ෂය : ........................................ අනුමතිය දුන් දිනය : ........................................

ඇස්තමේන්තු අංකය : ................................

වැඩ විස්තරය ........................................................................................................................
........................................................................................................................
........................................................................................................................

1. එක් පක්ෂයකට මින් මතු ප්‍රාදේශීය ලේකම් යනුවෙන් හඳුන්වනු ලබන ........................................ කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් තනතුර දරණ ........................................................................ ........................................................................ යන අයද (මින් පසු ලේකම් යනුවෙන් හඳුන්වන) ............................ ප්‍රාදේශීය ලේකම් සඳහා හෝ ඒ වෙනුවෙන් පූර්වෝක්ත තනතුර දරන අනුප්‍රාප්තිකයන්ද, අනෙක් පක්ෂයට ........................................................................................................ හි පදිංචි ........................................................................................................ සමාගමේ / ව්‍යාපාරයේ ආයතනයේ නමින් ව්‍යාපාර කටයුතු වල යෙදෙන නියමාකාරයෙන් ව්‍යවස්ථාපිත සමාගමක් වන සහ ........................................................................ හි ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය තිබෙන (මින් පසු "කොන්ත්‍රාත්කරු" යනුවෙන් සඳහන් කෙරෙන, එමෙන්ම එම යෙදුමට ඔහුගේ/ඔවුන්ගේ හිමිකරුවන් වෙනුවෙන් කටයුතු කරන්නන්, බලයලත් අය සහ නීති නියෝජිතයන් හෝ උචිත අවස්ථාවලදී ගැළපෙන පරිදි අනුප්‍රාප්තිකයින් සහ වෙනුවට නම් කරනු ලබන්නන් ඇතුළත් වේ.)

දෙපක්ෂය විසින් අත්සන් කර දින යොදන ලද ගිවිස්නාව පරිදි (මින්පසු මෙහෙයුම් පත්‍ර යනුවෙන් හඳුන්වන) පොදු කොන්දේසිවලට අනුකූල වන ලෙසද, පූර්වෝක්ත සැලසුම්/ප්‍රමාණ /බිල්පත්‍ර /රේට් ගණන් හා ප්‍රමිතීන්වල සඳහන් කර ඇති ලෙසද මුළු මුදල රුපියල් ........................................................................ ශත ...................... (රු. .............................) සමන්විත වැඩය කොන්ත්‍රාත්කරු කරගෙන යා යුතුය. ගිවිසුමට එළඹුණ මිල ගණන්වලට සහ මෙයට සම්බන්ධ උප ලේඛනයේ පෙන්නුම් කරන පරිදි සහ ලේකම් විසින් මැන බලා තීරණය කරන ආකාරයට අඩුවන හෝ වැඩිවන හෝ මුදල්වලට කොන්ත්‍රාත්කරුට හිමිකම් ඇත.

2. (මින්පසු "ලේකම්" යනුවෙන් හඳුන්වනු ලබන) ........................................ මැනවැයි පිළිගන්නා අන්දමට ඉතා හොඳ ද්‍රව්‍ය යොදා යෝග්‍ය හා ශක්තිමත් අන්දමට නිම කළ යුතුය.

3. පිළිගත හැකි යෝග්‍ය හේතූන් මත ලේකම් ලෙස කාලය දීර්ඝ නොකරන්නේ නම් 20....... ....... ....... දින හෝ දිනට ප්‍රථම ලේකම්ට හෝ ඔහු විසින් බලය පවරා දෙන ලද වෙනත් නිලධාරියෙකුට වැඩ අවසන් කර භාර දිය යුතුය.

**ප්‍රමාද ගාස්තු**

පූර්වෝක්ත වැඩ අවසන් කළ යුතු දිනට හෝ පිළිගත හැකි හේතූන් මත වැඩ අවසන් කිරීම සඳහා දීර්ඝ කරන ලද දිනට වැඩ අවසන් කර භාර දීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වුවහොත් එදින සිට ගත වන සෑම එක් දිනක් සඳහා ගිවිසුමේ කොන්ත්‍රාත් ගත මුදලින් 0.05% ක් හෝ කොන්ත්‍රාත් මුදලින් 5% ක උපරිමයකට යටත්ව ප්‍රමාද ගාස්තු ගෙවීමකට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

**4.** **කාර්ය සාධන සුරක්ෂණය**

පූර්වෝක්ත වැඩද මේ ගිවිස්නාවේ කොන්දේසි ප්‍රකාර පනවනු ලබන මොනයම් එබඳු අතිරේක වැඩද යථා විධියෙන් සහ නියමිත කාලය තුළ කිරීම සඳහා එම වැඩ සතුටුදායක අන්දමින් අවසන් කිරීමේ ගිවිස්නාවේ සපුරාලිය හැකි වන ලෙසද වැඩ අවසන් කරනු ලැබූ දින සිට ........................ මසක් ගතවන තෙක් ඒ සියලුම වැඩ අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වා ගන්නා ලෙසද, මේ ගිවිස්නාවේ කොන්දේසි ප්‍රකාර රජයට/පළාත් සභාවට හිමිකම් ඇති මුදල වශයෙන් කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු යම් මුදලක් ඇතිනාක්, ඒ සියලුම මුදල් යථා විධියෙන් ගෙවීමට හැකි වන ලෙසද, රජය/පළාත් සභාව අනුමත කරන බැංකුවක් හෝ රජයේ/පළාත් සභා අරමුදලෙහි ........................................................................................ (රු. ............................) වන මුදල තැන්පත් කළ බවද, කොන්ත්‍රාත්කරු මෙයින් පිළිගනු ලැබේ. තවද, පූර්වෝක්ත මුදල රජයට/පළාත් සභාවට කොන්ත්‍රාත්කරු විසින් මෙයින් උකස් කිරීමක්ද, යටත් කොට බැඳීමෙන්ද, පවරා දෙන ලදී. යථෝක්ත ගිවිස්නාවේ ප්‍රකාර කොන්ත්‍රාත්තුවේ සියලුම වැඩ නිසි පරිදි සම්පූර්ණ කරන තෙක්ද, ගිවිස්නාවේ උද්ගතවන සෑම බැරක්ම ගෙවා තමා නිදහස් වන තෙක්ද, පූර්වෝක්ත මුදල හෝ එයින් යම්කිසි කොටසක් හෝ ලබාගැනීමට කොන්ත්‍රාත්කරුට හිමිකම් නැත්තේය.

5. කොන්ත්‍රාත්කරු විසින් විශේෂයෙන්ම මෙහි විස්තර කර ඇති පරිදි මේ කොන්ත්‍රාත්තුවට අයත් වැඩ යථා පරිදි අවසන් කරනු ලැබේද, ඉහත කියන ලද පරිදි තමාගෙන් අයවිය යුතු සියළු මුදල් ගෙවා තමා කෙරෙහි පැවරී ඇති සියළු වගකීම් භාරගැනීම කොන්දේසි සහ නියම කර ගැනීම නියමාකාරයෙන් සපුරා ගනු ලැබේද, එයට පූර්වෝක්ත මුදල වන රුපියල් ........................................................................................ (රු. ............................) හෝ කොන්ත්‍රාත්කරුට ඒ වනවිට ගෙවිය යුතුව ඇති මුදල් හෝ මෙහි සඳහන් නඩත්තු කාලය අවසානයේදී (මින්පසු කරන නියමයන්ට යටත්ව) ගිවිස්නාවේ ප්‍රකාර කොන්ත්‍රාත්කරු විසින් තමා සතු සියළු වගකීම් ඉටුකළ බවට සහ පූර්වෝක්ත මුදල වන රු. ........................................................ (රු. ............................) ක් කොන්ත්‍රාත්කරු විසින් රජයට/පළාත් සභාවට ගෙවිය යුතු කිසිම මුදලක් නැති බවටද, ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයක මත කොන්ත්‍රාත්කරුට ගෙවනු ලැබේ.

මෙම ගිවිස්නාව හෝ වෙන යම් රජයේ/පළාත් සභාවෙන් කොන්ත්‍රාත්කරුට ලැබිය යුතු යම් මුදලක් ඇතොත් එම මුදලින් කොන්ත්‍රාත්කරුගේ රජයට/පළාත් සභාවට වන්දි හෝ අලාභ වශයෙන් අයවිය යුතු මුදලක් වේ නම් සම්පූර්ණ මුදල හෝ එයින් කොටසක් හිලව් කර ගැනීමට කොන්ත්‍රාත්කරු එකඟ වේ.

6. පූර්වෝක්ත වැඩ සම්බන්ධයෙන් සතුටුදායක ප්‍රගතියක් පෙන්වීමට අපොහොසත් වුවහොත්, හෝ සතුටුදායක ලෙස වැඩ කිරීමට අපොහොසත් වුවහොත්, ලේකම්ගේ අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක මෙම ගිවිස්නාව අවලංගු කිරීමට හිමිකම් ඇත්තේය. මෙසේ අවලංගු කිරීමේ හේතුව මත රජයෙන්/පළාත් සභාවෙන් හෝ ලේකම් තැනගෙන් වන්දි ඉල්ලීමට කොන්ත්‍රාත්කරුට හිමිකම් නැත.

කොන්ත්‍රාත්කරු පූර්වෝක්ත වැඩ සම්බන්ධයෙන් නිසි හා සාධාරණ ප්‍රගතියක් නොපෙන්වන බවට හෝ වැඩය සතුටුදායක ලෙස නොකරන බවට හෝ ප්‍රාදේශීය ලේකම්තැන තීරණය කර සහතිකයක් නිකුත් කළ අවස්ථාවක එම තීරණය අවසාන තීරණය වනු ඇත.

7. ප්‍රාදේශීය ලේකම් හා කොන්ත්‍රාත්කරු අතර ඇතිවන අන්‍යෝන්‍ය ගිවිසුම් ප්‍රකාර මෙම ගිවිස්නාවේ I වගන්තියේ නියමිත ලෙස සඳහන් මුදල හෝ ඔහුට ලැබීමට හිමි වෙනත් මුදල් කොන්ත්‍රාත්කරුට පෙර කී පරිදි ගෙවීමට හෝ ගෙවීමට සැලැස්වීමට ප්‍රාදේශීය ලේකම් මතු දැක්වෙන ප්‍රකාර ගෙවීමට බැඳේ. ඒ කෙසේදයත්,

(අ) ප්‍රාදේශීය ලේකම් සහතික කරනු ලබන පරිදි සහ වැඩ කෙරීගෙන යන පරිදි කොන්ත්‍රාත්කරුට කොටස් වශයෙන් මුදල් ගෙවනු ලැබේ. මින් ඉදිරියට මෙම සහතික අන්තර සහතික ලෙස හඳුන්වන අතර මෙහි සඳහන් 1 වන වගන්තියේ විධානවලට යටත් වේ.

(ආ) පූර්වෝක්ත පරිදි ගෙවිය යුතු මුදල වනාහි මැනීමෙන් හෝ මොනයම් ක්‍රමයකින් හෝ ලබා ගන්නා වූද, උපලේඛනගත ගාස්තු ප්‍රමාණ අනුව කරනු ලැබූවාවූද වැඩවල සම්පූර්ණ වටිනාකම සහ වැඩ බිමට ගෙනෙන ලද සිමෙන්ති ඇතුළු, එහෙත් වැලි හුණු හා සම්බන්ධ ද්‍රව්‍ය හැර ක්ෂය නොවන ද්‍රව්‍ය සහ බඩුවල තක්සේරු වටිනාකමින් පළාත් සභාව වෙත රඳවනු ලබන මුදල් අඩුකොට ශේෂවන මුදල වන්නේය. මින් මතුවට අන්තර සහතිකවල ඇතුළත් කළ යුත්තේ සාධාරණ ලෙස විධිමත් ලෙස සහ නියමිත කාලයට පෙර නොව, වැඩ බිමට ගෙනෙන ලද ද්‍රව්‍ය සහ බඩු, ප්‍රමාණවත් ලෙස ගබඩාකර සහ/හෝ අඩු වැඩිවලින් සහ අනෙකුත් උවදුරුවලින් සුරක්ෂිත කර තිබේනම් ඒවා පමණය. තවද, වැඩය සඳහා වැඩ බිමට ගෙනෙන ලද ද්‍රව්‍ය සහ බඩු සඳහා පූර්වෝක්ත ලෙස ගෙවා තිබෙන විට වැඩය සම්පූර්ණයෙන්ම නිම කර ප්‍රාදේශීය ලේකම් වෙත භාර දෙනතුරු වැඩ බිමෙහි තිබීමේදී නැතිවීම් හෝ හානිවීම් ගැන කොන්ත්‍රාත්කරු වගකීම් භාරගත යුතුයි.

(ඇ) පූර්වෝක්ත කී පරිදි රඳවා ගන්නා මුදල යථා පරිදි නිමකර වැඩවල වටිනාකමින් සහ / හෝ වැඩබිමට ගෙනෙන ලද ක්ෂය නොවන ද්‍රව්‍යවල සහ බඩුවල වටිනාකමින් සියයට දහයක් (10%) පෙර කී පරිදි මෙසේ රඳවා ගනු ලබන මුදලින් එකතුව රු. ........................................................................................ (රු. ............................) ක් වැඩවල පූර්ණ වටිනාකම සහ පෙර කී පරිදි ද්‍රව්‍ය වල තක්සේරු මිල ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරනු ඇත.

(ඈ) ප්‍රාදේශීය ලේකම්ට ඒත්තු යන පරිදි සියලුම වැඩ කොන්ත්‍රාත්තුවේ නියමිත පරිදි අවසාන වන තෙක් සම්පූර්ණ වැඩය වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් සම්පූර්ණ කිරීමේ සහතික නිකුත් කරන තෙක්ද රඳවා ගත් මුදල රජය / පළාත් සභාව වෙත ඇපයක් වශයෙන් තැබෙනු ඇත. ඉන් පසු එසේ රඳවා ගනු ලබන මුදල නඩත්තු කාලය අවසන් වීමෙන් අනතුරුව කොන්ත්‍රාත්කරුට ගෙවනු ලැබේ.

(ඉ) ප්‍රාදේශීය ලේකම් විසින් සම්පූර්ණ කිරීමේ සහතිකයක් නිකුත් කළ වහාම ඔහු විසින් එම වැඩය භාරගත යුතුයි. එතකුදු වුවත්, තමා පිළිගත හැකි සහ කොන්ත්‍රාත්තුවේ නියමිත පරිදි අවසාන කොට ඇති යම්කිසි වැඩක් වෙනත් සේවයක් වශයෙන් තම අභිමතය පරිදි භාරගැනීමට ඔහුට බලය තිබේ.

(ඊ) රජය / පළාත් සභාව මගින් කලින් ඒ ගොඩනැගිලි ආදියට ඇතුළු වන හෝ ඒවා භාරගැනීම හෝ එහි යම්කිසි කොටසක් වැඩට යොදා ගැනීම හෝ පාවිච්චි කිරීම හෝ කරනු ලැබුවද, මෙහි 9 වන වගන්තියේ දැක්වෙන පරිදි සහ මෙම ගිවිස්නාවේ දැක්වෙන ප්‍රකාරයට කොන්ත්‍රාත්කරු විසින් නඩත්තු කාල සීමාව තුළ එම වැඩය නිසි පරිදි නඩත්තු කළ බවට (මින්පසු මෙහි අවසාන සහතිකය යනුවෙන් හඳුන්වනු ලබන) සහතිකයක් ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කරන තෙක් කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් නොකළ හැටියට සලකනු ලැබේ. තවද පූර්වෝක්ත වැඩ හෝ ද්‍රව්‍ය සම්බන්ධයෙන් වංචාවක්, වංක කමක් හෝ වංචා සහගත සිදුවීමක් සිදුවී නැති නම්ද, ප්‍රමාණවත් පරිදි කරනු ලැබූ පරීක්ෂණයකින් පසු ඒකී වැඩ හෝ ද්‍රව්‍ය සම්බන්ධයෙන් තීරණාත්මක සාක්ෂියක් වශයෙන් සලකනු ලැබේ.

පෙර කී පරිදි හැර ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන කිසිදු සහතිකයක් හෝ පූර්වෝක්ත වැඩ හෝ ද්‍රව්‍ය සම්බන්ධයෙන් තීරණාත්මක සාක්ෂියක් වශයෙන් සලකනු නොලැබේ.

8. මෙම ගිවිස්නාවේ 6 වන වගන්තිය ප්‍රකාර ප්‍රාදේශීය ලේකම් ගිවිස්නාව අවලංගු කරන්නේ නම් වැඩය නතර කොට කොන්ත්‍රාත්කරුගේ වියදම දෙපාර්තමේන්තුව මගින් හෝ වෙනත් කොන්ත්‍රාත්කරුවකු ලබා වැඩය කරවා ගෙන වැය වන මුදල් කොන්ත්‍රාත්කරුගෙන් රජයට / පළාත් සභාවට අයකර ගත හැක. මෙම මුදල කොන්ත්‍රාත්තුවේ ප්‍රකාර වැඩය හෝ එයින් කොටසක් කර ඒ සඳහා කොන්ත්‍රාත්කරුගෙන් අයවිය යුතු මුදලට වැඩිවීමට පුළුවන. තවදුරටත් 7 වන වගන්තිය යටතේ රඳවාගත් මුදලින් කොන්ත්‍රාත්කරු වැඩියෙන් ගෙවිය යුතු මුදලක් වේ නම් රජය / පළාත් සභාව එම මුදල එයින් අයකර ගැනීමට ද කොන්ත්‍රාත්කරු එකඟ වේ.

9. ප්‍රාදේශීය ලේකම් විසින් අවසාන කිරීමේ සහතික නිකුත් කරනු ලැබූ මොහොතේ සිට ලිත් මාස ....... තුනක ....... කාලයක් ගතවන තුරු නොසුදුසු ද්‍රව්‍ය හෝ වැඩ නිසා යම් කොටසක් දුර්වල වුවහොත් එය නිවැරදි කර දීමට කොන්ත්‍රාත්කරු බැඳේ. එසේම නඩත්තු කාල පරිච්ඡේදය තුළ යුද්ධයකින්, කැරැල්ලකින් හෝ භූමි කම්පාවකින් හැර ගින්නකින්, පිපිරීමකින් හටගන්නා හදිසි අනතුරකින් කාලගුණය අනුව හටගන්නා ජල ගැල්ම වලින් / අනෙකුත් එබඳු ආරක්ෂක කළ හැකි අනතුරකින් වැඩවලට සහ / හෝ ද්‍රව්‍ය වලට සිදුවන අලාභ හානි වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වගකිවයුතු අතර, ඒ සියළුම අලාභ හානි තමාගේ වියදමින් කොන්ත්‍රාත්කරු

යථා තත්ත්වයට පැමිණ විය යුතුය. නඩත්තු කාල සීමාව ආරම්භ වීමට පෙර නොසුදුසු ද්‍රව්‍ය යෙදීමෙන් හෝ වැඩ තත්ත්වය දුර්වල වීම නිසා වැඩය හෝ කොටසක් ආදේශ කිරීම හෝ සිදු වුවහොත් කොන්ත්‍රාත්කරු බැඳී සිටින පරිදි එසේ කිරීමේදී සිදුවන හානි හා නැතිවීම් වලට ඔහු වගකිව යුතුය.

10. පූර්වෝක්ත වැඩ අවසන් කිරීමට පළමුව කොන්ත්‍රාත්කරුගේ මරණය සිදුවුවහොත් හෝ හවුල් ව්‍යාපාරය විසිරුවා හැරියහොත් හෝ සමාගම ගණන් බේරා වසා දැමුවහොත් හෝ පූර්වෝක්ත ගිවිස්නාව එකෙනෙහිම අවසන් වන බවට මෙයින් හෙළිදරව් වන ලෙසට එකඟ වන අතර, එම වැඩ තමා අතට ගෙන එකී වැඩ අවසන් කිරීම පිණිස එය වෙනත් කොන්ත්‍රාත්කරුවකුට පැවරීමට හෝ ප්‍රමාණවත් පරිදි කම්කරුවන් ඕවර්සියර්වරු හෝ ද්‍රව්‍ය යොදවා තමා විසින්ම කරවීමට හෝ ප්‍රාදේශීය ලේකම්ට ඇති හිමිකම කිසිවක් අවලංගු නොවේ. එසේම කොන්ත්‍රාත්කරුගේ මරණය සිදුවුවහොත් හවුල් ව්‍යාපාරය විසිරුවා හැරියහොත් හෝ සමාගම ගණන් බේරා වසා දැමුවහොත් හෝ එම අවස්ථාවේදී මෙම කොන්ත්‍රාත්තුවේ නියම සහ කොන්දේසි යටතේ රජයට / පළාත් සභාවට අයවිය යුතු යම්කිසි මුදලක් වේ නම් එම මුදල අගති විරහිතව පූර්වෝක්ත කොන්ත්‍රාත්කරු වන ..................................................................................................................................................... ගෙන් හෝ බුදලයෙන් හෝ මොහුගේ නීත්‍යානුකූල නියෝජිතයන්ගෙන් හෝ අයකර ගැනීමට ප්‍රාදේශීය ලේකම්ට නීතියෙන් අවසර ලැබේ.

මෙම ගිවිස්නාව එබඳු ආකාරයකින් අවසන් කිරීමට සිදුවුවහොත් ..................................................... .......................................................................................... හෝ නීත්‍යානුකූල නියෝජිතයාට වන්දි ඉල්ලීමට හිමිකම් නොලැබෙන නමුත් මෙම ගිවිස්නාවේ නියමයන් සහ කොන්දේසි ප්‍රකාර ඒකී ..................... ....................................................................................... ගෙන් හෝ ඔහුගේ බුදලයෙන් හෝ නීත්‍යානුකූල නියෝජිතයාගෙන් රජයට / පළාත් සභාවට අයවිය යුතු සියළු හිමිකම් වලට යටත් කොට කොන්ත්‍රාත්කරුගේ මරණය සිදුවූ හවුල් ව්‍යාපාරය විසිරුවා හැරියහොත් හෝ සමාගමේ ගණන් බලා වසා දැමූ දින තෙක් කරන ලද වැඩ වලට මුදල් ඉල්ලීමට ඔහුට හිමිකම් ඇත්තේය. තවද, මෙම ගිවිස්නාව යටතේ ඒකී ............................... ....................................................................................... ට ඔහුගේ බුදලයට හෝ ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයාට හෝ ගෙවිය යුතු මුදලින් හෝ මුදල් වලින් මේ ගිවිස්නාව යටතේ ඒකී .................................. ....................................................................................... විසින් කරන ලද ............................................ ................................................... (රු. ......................................) ක් රජයට / පළාත් සභාවට අයවිය යුතු මුදල අඩුකර නතර කර ගැනීමට ප්‍රාදේශීය උප ලේකම්ට බලය ඇත.

එතෙකුදු වුවත් මේ ගිවිස්නාවේ කොන්දේසි ප්‍රකාර රජයට/පළාත් සභාවට අයවිය යුතු යම්කිසි මුදලක් ඒකී ........................................................................................................................... ගෙන් හෝ ඔහුගේ බුදලයෙන් හෝ නීත්‍යානුකූල නියෝජිතයාගෙන් හෝ අයකර ගැනීමට ඇති බලය මෙයින් අවලංගු නොවේ.

11. සඳහන් කරන විස්තර හා ප්‍රමිති කොන්ත්‍රාත්තුවේ ම කොටසක් වන අතර, එය ගිවිස්නාවට එක්කර කියවිය යුතුය.

12. කොන්ත්‍රාත්කරු යටතේ සේවය කරන කිසිවෙක් අලාභ හානි වන්දි ආඥා පනතේ 117 වන ඡේදය අනුව රජයෙන්/පළාත් සභාවෙන් වන්දි ඉල්ලීමෙන් කොන්ත්‍රාත්කරු පළාත් සභාව නිදහස් කළ යුතුය.

13. හැකිතාක් දුරට වැඩකරගෙන යන ප්‍රදේශයෙන්ම පුහුණු සහ නුපුහුණු ශ්‍රී ලාංකික කම්කරුවන් තෝරා ගැනීමට කොන්ත්‍රාත්කරු ගිවිස ගනී.

කොන්ත්‍රාත්තුවේ සඳහන් මෙම අවශ්‍යතාවය සපුරාලීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වූ විට කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට ඉඩ තිබේ. එසේ වුවද අති විශේෂ හේතු සාධක මත ශ්‍රී ලාංකික නොවන කම්කරුවන් වැඩෙහි යොදවා ගැනීමට කොන්ත්‍රාත්කරුට හැකි වන්නේ කොන්ත්‍රාත්තුව අත්සන් කළ නිලධාරීගේ පැහැදිලි ලිඛිත අනුමැතියක් ඇතොත් එය පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගේ/ මාතර දිස්ත්‍රික් ලේකම්ගේ එකඟතාවයද ඇතිව පමණි.

එවැනි ලිඛිත අනුමැතියක් හෝ එකඟතාවයක් නොමැතිව ශ්‍රී ලාංකික නොවන කම්කරුවන් සේවයේ යොදවා ගැනීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව උල්ලංඝණය කිරීමකි.
මෙම කොන්ත්‍රාත්තුවේ හේතුන් සඳහා ශ්‍රී ලාංකික යන්නෙන් අදහස් කරන්නේ උපතින් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකි.

කම්කරුවන්ට ගෙවීම් සම්බන්ධයෙන් දැනට ක්‍රියාවේ යෙදෙන සියලුම රෙගුලාසි වලට හා මින්පසු පැනවෙන එබඳු සියළු කොන්දේසි වලට ඇතුළත් වන සේ මෙම කොන්ත්‍රාත්තුවට අදාල කම්කරුවන්ගේ සෑම අංශයකටම සාධාරණ ගෙවීමකට කොන්ත්‍රාත්කරු ගිවිසෙයි.

සඳහන් කරන ලද වැඩ සම්බන්ධයෙන් යොදා ඇති කම්කරුවන්ට අදාල චෝක්රෝල් හෝ පෙරෙටවු පොත් හෝ අනිකුත් ලිපිලේඛණ පරීක්ෂා කිරීමට පැමිණෙන ප්‍රාදේශීය ලේකම් නියමිත පරිදි බලය පවරන ලද රජයේ/පළාත් සභාවේ ඕනෑම නිලධාරියෙකුට අවසර දීමට කොන්ත්‍රාත්කරු බැඳේ.

14. ලියවිල්ලකින් වූ කැමැත්ත ඇතිව මිස නැත්නම් මේ කොන්ත්‍රාත්තුව වෙනත් යම්කිසිවෙකුට පැවරීමට කොන්ත්‍රාත්කරුට අයිතිවාසිකමක් නැත. තවද ඔහු විසින් තමා වෙනුවෙන් කර්මාන්තය කරගෙන යාමට ආණ්ඩුවේ කොන්ත්‍රාත් පිළිබඳ පොරොන්දු කඩකරන ලද කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවේ නම සඳහන් කිසිවෙකුට ඇටෝර්නි බලයක් නිකුත් නොකළ යුතුය.

15. **ආරවුල් බේරුම් කිරීම**

මින් ඉදිරියට ඕනෑම අවස්ථාවක දෙපක්ෂය හෝ ඔවුන්ගේ අදාල නියෝජිතයන් අතර ගිවිස්නාව හෝ එහි ප්‍රස්තුත කාරණය ගැන හෝ එයට සම්බන්ධ ඉදි කිරීම් හෝ වෙනත් ආකාරයේ පැනනඟින ප්‍රශ්නයක් හෝ වෙනසක් ඇති වන්නේ නම් සලාන්ශ්‍රීභාවෙන් ප්‍රධාන ලේකම් වෙත/ මාතර දිස්ත්‍රික් ලේකම් වෙත යොමුකළ යුතු අතර ඔහුගේ තීරණය දෙපාර්ශවයටම අවසාන සහ නිශ්චිත වනු ඇත. නමුදු එම තීරණය යම්කිසි පාර්ශවකරුවෙකුට අනුමත නොවන තත්ත්වයට දින 15 ක් ඇතුළත දී ඒ පාර්ශවකරු ලිඛිතකින් ඉල්ලීමක් කර සිටියහොත් ප්‍රධාන ලේකම්/මාතර දිස්ත්‍රික් ලේකම් විසින් මත භේදයට හේතු වූ කරුණු ගැන විභාග කොට තීරණයක් දීමට සුදුසු බේරුම්කරුවෙකු පත්කරනවා ඇත.

16. නීතිය පිළිබඳ වුවත්, ප්‍රස්තුත කාරණය පිළිබඳ වුවත්, එකී අයගේ තීරණය නොහොත් විනිශ්චය වන්නේය. මීට සම්බන්ධ වූ පාර්ශවකරුවන් විසින් එකී තීරණය හෝ ඒකී විනිශ්චය පිළිගත යුතුය.

මෙහි ............................. ප්‍රාදේශීය ලේකම් යනුවෙන් අදහස් කරන්නේ ..................................................... තනතුර දරන හෝ තනතුරේ වැඩ කරන හෝ එවකට ............................. ප්‍රාදේශීය ලේකම් විසින් ක්‍රියාත්මක කරන කාර්යයක් ආවරණය කරන්නා වේ.

20....... ....... ....... දින ............................................................................................................ දී යොදන ලදී.

.......................................
කොන්ත්‍රාත්කරුගේ අත්සන
(නිල මුද්‍රාව)

සාක්ෂිකරුවෝ :- 1. .......................................
2. .......................................

.........................................
ප්‍රාදේශීය ලේකම්
(නිල මුද්‍රාව)

සාක්ෂිකරුවෝ :- 1. .......................................
2. .......................................

KOT/DEV/01/FO/GEN/04/I